# පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය - 4 වන වර්ෂ පූර්ණය නිමිත්තෙන් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරුතුමන් ලක්වැසි සියලු ජනතාව අමතා කළ විශේෂ මාධ්‍ය නිවේදනය.

අහිංසක මිනිස් ජීවිත 272 ම්ලේච්ඡ ලෙස ඝාතනයට ලක්වූ සහ තවත් මිනිසුන් 500කගේ පමණ අනාගතය සම්පූර්ණයෙන්ම අඳුරට ඇද දැමූ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සිදු වී වසර 4ක් ගෙවී ගොස් තිබෙනවා. නමුත් එහි පසුපස සැඟවූ සත්‍යය හෙළිකර ගන්නට සහ එයට වගකිවයුත්තන් නීතිය ඉදිරියට ගෙන ඒමට මේ දක්වාම නොහැකි වී තිබෙනවා.

වසර 4ක් පුරා තවමත් අපි මෙහි සැඟවුන සත්‍යය සොයා ගැනීමේ උත්සාහය අත් නොහරින්නේත්, දිගින් දිගටම ඒ වෙනුවෙන් පෙනී සිටින්නේත්, මෙම ම්ලේච්ඡ ප්‍රහාරයට වසර 4ක් සම්පූර්ණ වන අප්‍රේල් 21 වන දින විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේත්, කුමන පරමාර්ථයක් පෙරදැරි කරගෙනද යන්න පැහැදිලි කිරීමට අද අපි මේ මාධ්‍ය සාකච්ඡාව සංවිධානය කළෙමු.

මේ කුමන්ත්‍රණය පිළිබඳව එකම යහපාලන රජයම පත්කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර්තාවද සනාථ කර ඇත. ශ්‍රී ලංකාව තුළ මෑත කාලයේ සිදුවූ මෙම දරුණුතම සහ ම්ලේච්ඡ මිනිස් ඝාතනය පසුපස මහා කුමන්ත්‍රණයක් තිබෙන බව හිටපු නීතිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය අපට හොඳ හැටි මතකය. එය දේශපාලන බලය දිනා ගැනීමේ කුමන්ත්‍රණයක් බව බොහෝ දෙනාගේ මෙන්ම අපගේද විශ්වාසයයි. ප්‍රහාරයේ සත්‍යය යට ගැසීමට එදා මෙදාතුරු රට පාලනය කළ ජනාධිපතිවරුන් සහ දේශපාලඥයන් මෙන්ම වත්මන් ජනාධිපතිවරයා සහ රජයත්, ඇතැම් දූෂිත රාජ්‍ය නිළධාරිනුත් දරන මෙම උත්සාහය පසුපස ඇති දූෂිත පරමාර්ථය වන්නේ එම අපරාධකරුවන් ආරක්ෂා කිරීම බව ඉතා පැහැදිලිය.

පාස්කු ඉරිදා ම්ලේච්ඡ මිනිස් ඝාතනය පමණක් නොව, මෑත ඉතිහාසය පුරා සිදුවූ දේශපාලන ඝාතන, පැහැරගැනීම්, අතුරුදහන් කිරීම් මෙන්ම ජාතිවාදය සහ ආගම්වාදය ඇවිස්සීම වැනි මහා අපරාධ රාශියක සත්‍යය යටගසා, නීතිය හා යුක්තිය ක්‍රියාත්මක කිරීම දේශපාලන බලයට යට කරමින් මේ දක්වාම සිදුකර ඇත්තේ, තමන් බලයට ගෙන ඒමට සහ තම බලය ආරක්ෂා කර ගැනීමට

දූෂිත දේශපාලකයින් හට උදව්වූ මෙම මහා අපරාධකරුවන් ආරක්ෂා කිරීමය යන සත්‍යය මේ රටේ යුක්තිගරුක සහ සාධාරණ පුරවැසියන් සියළු දෙනා අවබෝධ කරගැනීම මේ රටේ අනාගතය සඳහා ඉතා වැදගත් වන්නේය.

මේ සියලු අපරාධ කාලයේ වැලිතලාවට යට කොට මේ රටේ මිනිසුන්ට මේ සියල්ල අමතක වී යාමට සැලැස්වීම මේ දූෂිත දේශපාලන සංස්කෘතියේ ප්‍රධාන උපාය මාර්ගයයි. වසර 4ක් පුරා අප උත්සාහ දරන්නේ, එම කූටෝපාය පරාජය කරමින්, පාස්කු ඉරිදා ම්ලේච්ඡ මිනිස් ඝාතනයේ සත්‍යය හෙළිදරව් වී, යුක්තිය ඉටුවනතුරු, අපගේ උත්සාහය අපි අත්නොහරින බව මෙම රාජ්‍ය අපරාධකරුවන්ට පෙන්වා දීමටය.

මෙම උත්සාහය අපි අමතක කොට අතහැර දැමුවහොත් මේ රට තුළ භයානක පූර්වාදර්ශයක් ගොඩනැගීමට බොහෝ දුරට ඉඩ ඇති බව අපගේ විශ්වාසයි. දේශපාලන බලය දිනාගැනීම සහ එය පවත්වාගෙන යාම සඳහා සිදුකරන ඕනෑම අපරාධයකට සත්‍යය යටගැසීම පිණිස මෙන්ම එම අපරාධකරුවන් ආරක්ෂා කිරීම පිණිස ගොඩනැගෙන දූෂිත දේශපාලන බලාධිකාරයක් සහ දේශපාලනීකරණයට ලක්වූ නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් මේ රට තුළ තිබෙන නිසා දේශපාලන බලය දිනා ගැනීමේ හොඳම සහ සාර්ථකම ක්‍රමය පාස්කු ප්‍රහාරය වැනි ම්ලේච්ඡ මිනිස් ඝාතනයක් සිදුකොට ඒ ඔස්සේ ජාතිවාදය සහ ආගම්වාදය ඇවිස්සවීම බවත් තහවුරු වීම මෙම භයානක පූර්වාදර්ශය ලෙස අපි දකිමු.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ සත්‍යය හෙළිදරව් කරගෙන, එහි මහමොලකරුවන් අපරාධකරුවන් නීතියට කොටුකර නොගතහොත්, දැනටමත් නිදැල්ලේ සිටින මෙන්ම විවිධ වරප්‍රසාදයන්ද දේශපාලන රැකවරණයද භුක්ති විඳින මේ අපරාධකරුවන්, ඉහත දැක්වූ පූර්වාදර්ශය අනුව යමින් අනාගතයේදීද බලය දිනාගැනීම සඳහා මිනිස් ඝාතන සිදුකිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීමට ඉඩ ඇති බව පැහැදිලිය.

එම නිසා පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ සත්‍යය සහ යුක්තිය ඉල්ලා අප්‍රේල් 21 වන සිකුරාදා ශක්තිමත් ජන පවුරක් ඉදිකිරීමට ජාති ආගම් භේදයකින් තොරව එකට එක්වන ලෙස අපි රටේ සියලු පුරවැසියන් ගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

# ජන පවුර

## 2023 අප්‍රේල් 21 වැනිදා - පාස්කු ඉරුදින ප්‍රහාරයට වසර 4ක් සපිරීම - නිමිත්තෙන් කොළඹ - මීගමු මාර්ගයේ තනන ජන පවුර

**පාස්කු ප්‍රහාරයේ වින්දිතයින් හට යුක්තියත්, දේශපාලනීකරණයෙන් දුර්වලකර ඇති රටේ නීතියේ ස්වාධිපත්‍යය නැවත ශක්තිමත් කරන ලෙසත් ඉල්ලා බල කිරීමට සඳහා ජන පවුරක් තැනීමට ජාති, ආගම්, පක්ෂ භේදයෙන් තොරව එක්වන ලෙස අපි මේ රටේ සියලු පුරවැසියන්ගෙන් ඉල්ලා සිටිමු.**

**ඒ සඳහා අප්‍රියෙල් 21 සිකුරාදා පෙ. ව. 8:30 ට කොළඹ කොච්චිකඩේ සා. අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ සිට කටුවාපිටියේ ශාන්ත සෙබස්තියන් මුනි දේවස්ථානය දක්වා වන කොළඹ - මීගමු ප්‍රධාන මාර්ග වෙත පැමිණිය හැකි සියලු දෙනා එම මාර්ගය වෙත පැමිණ මඟ දෙපස පෙළ ගැසී හිටගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා. මීට වසර හතරකට පෙර පළමු බෝම්බ ප්‍රහාරය සිදුවූ වේලාව වන පෙ.ව 8:45 සිට විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කරන ලෙසද එදින පෙ.ව 8.30 සිට පෙ.ව 9.00 දක්වා පැය බාගයක කාලයක් නිශ්ශබ්දව සහ සාමකාමීව එහි රැඳීසිටින මෙන්ද අපි ඔබෙන් උදක්ම ඉල්ලා සිටිනවා.**

මේ රටේ නීතියේ ස්වාධීනත්වය, යුක්තිය හා සාධාරණය රජයන සමාජයක් බිහිකිරීම සියල්ලටම වඩා අපට අවශ්‍ය බව අප රටේ නායකයින් වෙත පෙන්වා සිටීමට ජාති, ආගම්, උස් පහත් භේද අත හැරදා මව්බිමට ආදරය කරන පුරවැසියන් ලෙස එකතු වී ඊට ඔබේ උපරිම සහයෝගය ලබා දෙනු ඇතැයි අපි අපේක්ෂා කරනවා.

**එදින කාර්යාලවල, කම්හල්වල සහ අනෙකුත් වැඩබිම්වල සිටින සියලුදෙනාගෙන් අප ඉල්ලා සිටින්නේ, පෙ.ව. 8:45 ට තමන් සිටින ස්ථානයේ නැගිට සිට, විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කරන ලෙසයි.**